# ජාතික රාජ්‍ය සභාවේ

# 1974 අංක 36 දරන පටපණු බීජ පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 8 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

## ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 36 දරන පටපණු බීජ පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 8 වන දින]

එල්.ඩී.—ඕ. 48/73.

පටපණු බීජ නිෂ්පාදනය කිරීම, සැපයීම හා බෙදාහැරීම විධිමත් කිරීම සහ පටපණු රෝග මර්දනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් එයට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 36 දරන පටපණු බීජ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක වන්නේ ය.

බලපත්‍ර අධිකාරි.

2. අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් මේ පනතේ කාර්යයන් සඳහා බලපත්‍ර අධිකාරි වශයෙන් නමින් හෝ ධුරයෙන් යම් තැනැත්තකු කලින් කල නාමෝද්දේශනය කළ හැකිය.

පටපණු බීජ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙද හැරීම හා විකිණීම තහනම් කිරීම.

3. කිසිම තැනැත්තකු විසින්, පටපණු බීජ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බෙදා හැරීම හෝ බැහැර කිරීම, මේ පනත යටතේ බලපත්‍ර අධිකාරි විසින් ඒ සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලය යටතේ හැර හෝ එකී බලපත්‍රයේ නියමයන් හෝ කොන්දේසි අනුව නොවන වෙනත් ආකාරයකට නොකළ යුතුය.

පටපණුවන් බෝකිරීම තහනම් කිරීම.

4. බලපත්‍ර අධිකාරි විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන තැනැත්තකුගෙන් ලබාගත් පටපණු බීජ නොවන වෙනත් පට පණු බීජවලින් කිසිම තැනැත්තකු විසින් පටපණුවන් බෝ නොකළ යුතුය.

බලපත්‍ර ඉල්ලීම.

5. පටපණු බීජ නිෂ්පාදනය කිරීමට, ගබඩා කිරීමට, ප්‍රවාහනය කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බෙදා හැරීමට හෝ බැහැර කිරීමට බලාපොරොත්තු වන සෑම තැනැත්තකු ම විසින් බලපත්‍රයක් සඳහා නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් බලපත්‍ර අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

බලපත්‍ර පැවරිය නොහැකි බව.

6. (1) මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද කිසිම බලපත්‍රයක් වෙන යම් තැනැත්තකුට නොපැවරිය යුතු අතර ඒ අනුව මේ උපවගන්තියේ කලින් සඳහන් විධිවිධාන උල්ලංඝනය කරමින් කරන ලද යම් පැවරීමක් ශුන්‍ය හා බලරහිත වන්නේ ය.

(2) මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද කිසිම බලපත්‍රයක් වෙන යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා පාවිච්චි නොකළ යුතුය.

2—ඊ 09219—11,340 (74/09)

බලපත්‍ර අත්හිට වීමේ හෝ අවලංගු කිරීමේ බලය.

7. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යම් තැනැත්තකු කඩ කරන අවස්ථාවක බලපත්‍ර අධිකාරි විසින් නියමයක් මගින් එකී බලපත්‍රය එකී නියම යෙහි නිශ්චිත ව සඳහන් යම් කාලයකට අත්හිටුවීම හෝ එකී බල පත්‍රය අවලංගු කිරීම හෝ කළ හැකිය.

(2) බලපත්‍රලාභියාට විරුද්ධ ව (1) වන උපවගන්තිය යටතේ කිසිම නියමයක්, එකී නියමය නො කළ යුත්තේ මන්දැයි දැන්වීමේ නිශ්චිත ව සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත හේතු දක්වන ලෙස දැන්වීමක් ඔහුට දීමෙන් පසුව සහ එකී කාලසීමාව ඇතුළත හේතු දක්වීම ඔහු පැහැර හරින්නේ නම් මිස හෝ සෑහෙන හේතු ඔහු නොදක්වන්නේ නම් මිස, කරනු නොලැබිය යුතුය.

ඇතුළුවීමේ හා පරීක්ෂා කිරීමේ බලය.

8. (1) බලපත්‍ර අධිකාරි විසින් හෝ එකී බලපත්‍ර අධිකාරි විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්,—

(අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යක් අනුව ක්‍රියා කරනු ලබන්නේ ද යන්න දැන ගැනීමේ කාර්යය සඳහා, නියම කරනු ලබන යම් තොරතුරක් සපයන ලෙස යම් පටපණුවන් බෝකරන්නකුට හෝ බලපත්‍රලාභිය කුට ලිඛිත නියමයක් මගින් නියම කළ හැකිය ;

(ආ) එකී පටපණුවන් බෝ කරන්නා හෝ බලපත්‍රලාභියා විසින් තබා ගනු ලබන යම් ලේඛන හෝ වාර්තා පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කරවීම කළ හැකිය ;

(ඇ) යම් පටපණු රෝගයක් තිබෙන්නේ ද නැද්ද යන්න සොයා බැලීමේ අදහසින් පටපණුවන් බෝ කරන යම් ඉඩමකට, භූමියකට හෝ ස්ථානයකට හිරු උදාව හා හිරු බැසයාම අතර ඕනෑම වේලාවකදී ඇතුළුවී එය පරීක්ෂා කිරීම කළ හැකිය ;

(ඈ) යම් ස්ථානයක විෂබීජ නැසීම හෝ යම් පටපණු බිජ හෝ පටපණුවන් විනාශ කිරීම හා නියම කරනු ලබන වෙනත් ක්‍රියා ඇතුළු ව පටපණු රෝග පැතිරීම වැළැක්වීම පිණිස තමා විසින් අවස්ථානුකූලයැයි හෝ අවශ්‍ය යැයි සලකනු ලබන යම් පියවර ගන්නා ලෙස එකී පටපණුවන් බෝ කරන්නාට හෝ බලපත්‍රලාභියාට නියම කළ හැකිය.

(2) කලින් වූ උපවගන්තියේ (ඇ) හා (ඈ) ඡේදවල සඳහන් යම් ඉඩමක, භූමියක හෝ ස්ථානයක සෑම අයිතිකරුවකු ම, භුක්ති කරුවකු ම, පටපණුවන් බෝකරන්නකු ම හෝ බලපත්‍රලාභියකු ම විසින් හෝ එකී ඉඩම, භූමිය හෝ ස්ථානය භාරව සිටින යම් තැනැත් තකු විසින්, බලපත්‍ර අධිකාරිට හෝ යම් බලය ලත් නිලධරයකුට ඇතුළුවීමට ඉඩ දී (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී බලධරයාගේ හෝ නිලධරයාගේ කාර්යයන් කර ගෙන යාමට ඔහුට අවසර දිය යුතුය.

නියෝග.

9. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන කරගෙන යාමේ හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සෑදිය හැකිය.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ල ම හෝ ඉන් යමක් සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකිය :—

(අ) පටපණු බීජ ආනයනය කිරීම හෝ ආනයනය තහනම් කිරීම ;

(ආ) පටපණු බීජ දිවයින තුළට ගෙන එනු ලබන ඕනෑම අවස්ථා වක දී ඒවා පරීක්ෂා කිරීම ;

(ඇ) යම් රෝගයක් වැළඳී ඇතැයි සොයා ගත් හෝ අනුමාන කරනු ලැබූ පටපණු බීජ, ලබන්නාගේ වියදමින් ශුද්ධ කිරීම හෝ ඒවායේ විෂබීජ නැසීම ;

(ඈ) ආනයනය කරනු ලබන පටපණු බීජ නිරෝධායනයෙහි තැබීම ;

(ඉ) දිවයිනෙහි යම් ප්‍රදේශයක් රෝග ග්‍රස්ත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කිරීම හා එකී ප්‍රදේශය නිසි පරිදි නිරෝධායනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීම ;

(ඊ) රෝගය වැළඳුණු හෝ රෝගය බෝවී ඇති පටපණුවන්, පටපණු බිත්තර, පිලා කෝෂ, සලබයන් හා යම් උපකරණ විනාශ කිරීම හෝ ඒ සම්බන්ධයෙන් නිසි පරිදි සුදුස්සක් කිරීම ;

(උ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලත් නිලධර යන් පත්කිරීම ;

(ඌ) මේ පනතේ විධිවිධානවලට යටත්ව බලපත්‍ර ප්‍රදානය කරනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා ;

(එ) බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන තැනැත්තන් ගණය, කාලසීමාව හා ඒවා නිකුත් කරනු ලබන්නේ යම් නියම යන්ට හා කොන්දේසිවලට යටත්ව ද එකී නියමයන් හා කොන්දේසි ;

(ඒ) බලපත්‍ර සඳහා ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේ හෝ ඒවා පිළිබඳ සුදුස්සක් කිරීමේ ක්‍රමය හා ආකාරය ;

(ඔ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග අනුව ක්‍රියා කරන බව සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ද බලපත්‍රලාභියකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයට අදාළ වන්නා වූ ද සියලු ප්‍රකාශ හා ප්‍රකාශන සැපයීම ; සහ

(ඕ) බලපත්‍රලාභියකු විසින් පිළිපැදිය යුතු සම්මත තත්ත්වයන් හා එකී සම්මත තත්ත්වයන්ට පටහැනි ක්‍රියා හෝ අකෘත තහනම් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් යම් පසු දිනක එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක් අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන්නේ ය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

අභියාචන.

10. (1) බලපත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම හෝ අත් හිටුවීම පිළිබඳ බලපත්‍ර අධිකාරිගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තාට එකී තීරණය දන්වනු ලැබීමෙන් පසු දින දහතරක් ඇතුළත එකී තීරණයට විරුද්ධ ව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී, එකී අභියාචනය යොමු කරනු ලැබුවේ යම් නියමයකට විරුද්ධ ව ද එකී නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකිය.

(3) මේ වගන්තියේ කලින් සඳහන් විධිවිධාන යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක වන අතර කිසිම අධිකරණයක දී ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න නොකළ යුතුය.

වැරදි හා දණ්ඩන.

11. (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් කඩ කරමින් ක්‍රියා කරන හෝ ඒවා අනුව ක්‍රියා කිරීම පැහැර හරින;

(ආ) බලපත්‍රයක යම් කොන්දේසියක් කඩ කරමින් ක්‍රියා කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින;

(ඇ) මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් බලය ලත් නිලධරයකු විසින් දෙන ලද යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින; හෝ

(ඈ) බලයලත් නිලධරයකු විසින් මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි දී හෝ තම යුතුකම් ඉටු කිරීමෙයි දී ඒ බලය ලත් නිලධරයාට අවහිර කරන හෝ බාධා කරන

යම් තැනැත්තෙක් වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එක් මසකට නො අඩු හා එක් වර්ෂයකට නො වැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් සියයකට නො අඩු හා රුපියල් එක් දහසකට නො වැඩි දඩයකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම යටත් වන්නේ ය.

12. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක,—

සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ වගකීම.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් වරද කරන අවස්ථාවේදී, ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, ලේකම් හෝ වෙනත් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තකු ම හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් වරද කරන අවස්ථාවේ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු වූ සෑම තැනැත්තකු ම

තම දැනුම හෝ ගුප්තානුකූලතාව නොමැති ව එකී වරද කරනු ලැබූ බවත් වරද කිරීම වැළැක්වීම පිණිස තම කාර්යයන්ගේ ස්වභාවය හා සියලු අවස්ථාවන් සැලකිල්ලට ගෙන තමා විසින් ක්‍රියා කළ යුතු පරිදි නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බවත් ඔප්පු කරන හොත් මිස ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

13. මේ පනතේ කාර්යයන් සඳහා—

අර්ථ නිරූපණය

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියම කරනු ලැබූ බව අදහස් වේ;

"පටපණුවා" යන්නට මල් බෙරි පටපණුවා, ටසෝ පටපණුවා, එරි පටපණුවා සහ මූග පටපණුවා ඇතුළත් වේ;

"පටපණු බීජ" යන්නෙන් පටපණු බිත්තර පිළියෙල කිරීම සඳහා පාවිච්චි කරනු ලබන පිලා කෝෂ, සලබයන්, බිත්තර සහ ප්‍රජනනය කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන කවර හෝ විස්තරයකට අයත් පිලා අවස්ථාවේ වූ පටපණුවකු අදහස් වන අතර එයට ඒවා ඇතුළත් වේ;

"පටපණුවන් බෝකරන්නා" යන්නෙන් පිලා කෝෂ සෑදීම සඳහා පටපණුවන් බෝ කිරීමෙහි නිරත ව සිටින තැනැත්තෙක් අදහස් වේ;

"පිලා කෝෂ" යන්නෙන් පටපණුවා විසින් සාදන ලද පිලා කෝෂයක් අදහස් වේ;

"බලපත්‍ර අධිකාරී" යන්නෙන් නියමිත ආකාරයට අමාත්‍යවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"බලපත්‍රය" යන්නෙන් පටපණු බීජ නිපදවීමේ, ගබඩා කිරීමේ, ප්‍රවාහනය කිරීමේ, විකිණීමේ, බෙදා හැරීමේ හෝ බෑහැර කිරීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් අදහස් වේ ;

"බලය ලත් නිලධරයා" යන්නෙන් මේ පනතේ කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ;

"රෝගය" යන්නට යම් පටපණුවකුට හානි කරන හෝ පටපණුවකුගෙන් පරිපෝෂණය වන යම් දිලීර, බැක්ටීරියා, වෛරස්, ප්‍රොටසෝවා සහ වෙනත් ජීවීන් විසින් ඇති කරන සියලු ම රෝග ඇතුළත් වේ.